වසරකට පුද්ගලයින් 703,000 ක පමණ ප්‍රමාණයක් දිවි තොර කරගැනීම් ඔස්සේ මිය යන බව, ලෝක සෞඛ්‍ය සංවිධානය ඇස්තමේන්තුගත කරයි. එම සෑම දිවි තොර කරගැනීමකටම පුද්ගලයින් විස්සක් පමණ දිවි තොර කරගැනීමට උත්සාහ කරන බවද ඔවුන් වැඩිදුරටත් පෙන්වා දේ.

දිවි තොර කරගැනීම් යනු මහජන සෞඛ්‍ය ගැටළුවක් ලෙසින් වාර්තා කිරීම අපේක්ෂා කළත්, එම වාර්තා කිරීම් හැකිතාක් දුරට ප්‍රවේසම් සහගතව සහ මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූලව සිදු කරන ලෙසට මාධ්‍ය වෙත උපදෙස් ලබාදේ. ඒ, එම පුවත් වාර්තාවන් ඔස්සේ ද අනුබල ලැබිය හැකි අනුකාරක සිදුවීම් අවම කිරීම සඳහායි.

කෙසේ නමුත්, මාධ්‍ය විසින් එම දිවි තොර කරගැනීම් වාර්තාකරණය පිළිබඳ මාධ්‍ය මාර්ගෝපදේශයන් කෙතරම් දුරට පිළිපදින්නේද යන්න ගැටළුවකි.

අප්‍රේල් 06, 2023 දින ලංකාදීප සහ අරුණ පුවත්පත් තුළ පළවී තිබූ දිවි තොර කරගැනීම් සම්බන්ධ පුවත් වාර්තාවන් දෙකක් මීට නිදසුන් ලෙසින් ගත හැක.

මෙම පුවත් වාර්තාවන් කෙතරම් දුරට වගකීම් සහගතව පළ වී ඇතැයි ඔබ සිතන්නේ ද?

උපකාරක අංකයක් පළ කරමු! ජීවිතයක් රැක ගනිමු!

හදිසි උපකාරක අංක:

*CCCline - 1333

* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860

*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

(මෙම පුවත්, එදින මෙම පුවත්පතේ සහෝදර ඉංග්‍රීසි පුවත්පත තුළ වාර්තා වී නොතිබුණි.)

මූලාශ්‍ර:

https://www.who.int/cam.../world-suicide-prevention-day/2022
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...
https://media.samaritans.org/.../Media_Guidelines_FINAL...

- ✕ දිවි අහිමි කරගත් ආකාරය සඳහන් කර ඇත.
- ✕ දිවි අහිමි කර ගැනීමට පෙර ලියු ලිපි ආදිය පළ කර ඇත.
- ✕ දිවි අහිමි කරගත් පුවත පළමු පිටුවෙහි ප්‍රමුඛතාවයෙන් යුතුව පළ කර ඇත.
- ✕ උපකාරක අංක සඳහන් කර නැත.




